# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2016 10 ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව

නම : ......................................................................... කාලය : පැය 3

- ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.

1) වේදිකා නාට්‍යයක්
   1. කියවා හා අසා රස විඳීමට තිබෙන්නකි. 2. කියවා රස විඳීමට තිබෙන්නකි.
   3. අසා රස විඳීමට තිබෙන්නකි. 4. නරඹා රස විඳීමට තිබෙන්නකි.

2) දෘශ්‍ය කලා හා ප්‍රාසාංගික කලා අතර ප්‍රධාන වෙනස ඇති වන්නේ,
   1. තනිව රස විඳීමට හැකි නිසා 2. සජීවී බව නිසා
   3. අසා රස විඳීමට තිබෙන්නකි. 4. නරඹා රස විඳීමට තිබෙන්නකි.

3) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් නොවන්නේ
   1. චිත්‍රපට 2. රූපවාහිනී නාට්‍ය 3. චිත්‍ර 4. ඔපෙරා

4) නෘත්‍ය ගනයට අයත් නර්තන අංගයක් ඉදිරිපත් කිරීමේදී
   1. ආංගික අභිනය මගින් අදහස් ප්‍රකාශ වේ.
   2. සාත්වික අභිනය මගින් අදහස් ප්‍රකාශ වේ.
   3. වාචික අභිනය මගින් අදහස් ප්‍රකාශ වේ.
   4. කිසිඳු අභිනයක් මගින් අදහස් ප්‍රකාශ නොවේ.

5) නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය අතරින් නෘත්‍ය ගනයට අයත් නර්තනාංගයකි.
   1. ලී කෙළි 2. කළගෙඩි 3. සවරං 4. භරත නාට්‍යයයි

6) "නාට්‍ය පෙළ ලෙස හඳුන්වන්නේ,
   1. පාත්‍ර වර්ගය 2. පසුතල නිර්මාණ 3. නාට්‍ය පිටපත 4. රංග භූමිය

7) රංග ක්‍රීඩාවේ යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජනයකි.
   1. අන් මතයන්ට ගරු නොකිරීම
   2. සාමූහිකව කටයුතු කිරීමට හුරු නොවීම
   3. ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය වීම
   4. ජය පරාජය විඳ දරාගැනීමට නොහැකි වීම

8) ස්වසන අභ්‍යාසය සිදු කිරීම වැදගත් වන්නේ,
   1. වාචික අභිනයට 2. ආංගික අභිනයට 3.ආහාර්ය අභිනයට 4.සාත්වික අභිනයට

9) තමාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන චලන රටා හඳුන්වන්නේ,
   1. ස්ථිතික චලන 2. ස්වභාවික චලන 3. නිර්මිත චලන 4. තාලානුකූල චලන

10) නළුවා පංචේන්ද්‍රිය මගින් ලබාගන්නා අත්දැකීම් ප්‍රේක්ෂකයාට තේරුම් ගත හැකි වන පරිදි ප්‍රතිනිර්මාණය කිරීම
   1. ආරෝපනයයි 2. පරිකල්පනයයි 3. සමාරෝපණයයි 4. රූපනයයි

11) ඇය කන, දිව, නාසය, ශරීරය හා මනස යන ඉන්ද්‍රියන් ක්‍රියාකාරීව කරනු ලබන අභිනය වන්නේ,
1. සංවේදන අභ්‍යාස 2. උණුසුම් අභ්‍යාස
3. සිරීලකරණ අභ්‍යාස 4. චලන අභ්‍යාස

12) හිම කන්දක් දියවී යනවා සේ හිසෙහි සිට ක්‍රමයෙන් ශරීරාංග සියල්ල ලිහිල් කිරීම
1. ස්වසන අභ්‍යාසයකි 2. සිථිලකරණ අභ්‍යාසයකි
3. සංවේදන අභ්‍යාසයකි 4. චිත්ත ඒකාග්‍රතා අභ්‍යාසයකි

13) යම් නළුවෙක් හෝ නිළියක් තම ස්වරූපය අතහැර වෙනත් ස්වරූපයකට ආවේශ වීම
1. අනුකරණයයි 2. අභිරූපණයයි 3. අනුරූපණයයි 4. සමාරෝපණයයි.

14) නාට්‍යයක් ලෝකයේ පවතින ස්වභාවයට අනුකූලව ඉදිරිපත් කරන්නේ නම්,
1. අතාත්වික ලෙස හඳුන්වයි. 2. නාට්‍ය ධර්මී ලෙස හඳුන්වයි.
3. ලෝක ධර්මී ලෙස හඳුන්වයි. 4. අසම්මත ලෙස හඳුන්වයි.

15) නාට්‍ය ධර්මී ශෛලියේ ලියවුණු නාට්‍ය පෙළකි,
1. කැලණි පාලම 2. මනමේ 3. විකෘති 4. මෝදර මෝල

16) ආලේ බැන්ද මාගෙ රම්‍යවන් ....... මෙම ගීතය අයත් නාට්‍ය
1. විකෘති 2. රතු හැට්ටකාරි 3. නරිබෑණා 4. දික්තල කාලගෝල

17) නාට්‍යයක් රඟ දැක්වීමේදී
1. රංග ශාලාවක් අත්‍යවශ්‍ය වේ. 2. ප්‍රේක්ෂක සහභාගිත්වය අනිවාර්යය වේ.
3. ගීත අත්‍යවශ්‍ය වේ. 4. පසුතල නිර්මාණ අත්‍යවශ්‍ය වේ

18) අංග රචනය කිරීමේදී මුහුණ ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් ගණන
1. 04 කි. 2. 05 කි. 3. 06 කි. 4. 07 කි.

19) මූලික වශයෙන් අංග රචනය ප්‍රධාන කොටස්
1. 02 කි. 2. 03 කි. 3. 04 කි. 4. 05 කි.

20) සූනියම් යාගයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලියකි,
1. නානුමුරය 2. කපුයක්කාරිය 3. දහ අට සන්නිය 4. වඩිගපටුන

21) පහත රටට ආවේණික ශාන්ති කර්මයක් නොවන්නේ,
1. කොහොඹා කංකාරිය 2. රට යකුම 3. සන්නි යකුම 4. සූනියම් යාගය

22) දික්තල කාලගෝල නාට්‍යට පාදක වූ කතා පුවත ඇතුළත් වන්නේ,
1. උම්මග්ග ජාතකයේ ය. 2. කුස ජාතකයේ ය.
3. සද්ධර්ම රත්නාවලියේ ය 4. කව් සිළුමිණේ ය.

23) දික්තල කාලගෝල නාට්‍යයේ
1. නාඩගම් රාග තාල ගීත ඇත.
2. සොකරි කවි ආශ්‍රයෙන් නිර්මාණය වූ ගීත ඇත.
3. කෝලම් කවි ආශ්‍රයෙන් නිර්මාණය වූ ගීත ඇත.
4. ශාන්ති කර්ම කවි ඇසුරෙන් නිර්මාණය වූ ගීත ඇත.

24) හෙන්රි ජයසේන මහතා විසින් නිර්මාණය නොකරන ලද නාට්‍යයකි,
1. කුවේනි 2. ජනේලය 3. තල මල පිපිලා 4. හුණුවටයේ කතාව

25) ටෙනිසි විලියම්ගේ "ද ග්ලාස් මෙනාජරි" නාට්‍යයේ පරිවර්තනයකි.
1. හෙන්රි ජයසේන මහතාගේ මකරා
2. හෙන්රි ජයසේන මහතාගේ අහස් මාලිගා
3. හෙන්රි ජයසේන මහතාගේ ජනේලය
4. හෙන්රි ජයසේන මහතාගේ මනමාලයෝ

26) 1974 වර්ෂයේදී නිෂ්පාදිත සුභ සහ යස නාට්‍යයේ රචනය හා අධ්‍යක්ෂණය
1. හෙන්රි ජයසේන මහතා 2. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
3. සුගතපාල ද සිල්වා මහතා 4. සයිමන් නවගත්තේගම මහතා

27) "හතික වරව් කොල්ලනේ මෙන්න මෙහේ වරෙව්" මෙම ගීතය ඇතුළත් නාට්‍ය වන්නේ,
1. කුවේනි 2. සුදු සහ කළු 3. බෙරහඬ 4. හුණුවටයේ කතාව

28) බන්දුල ජයවර්ධන මහතා විසින් 1961 දී නිර්මාණය කරන ලද බෙරහඬ නාට්‍ය
1. පරිවර්තනයකි. 2. අනුවර්තනයකි 3. ස්වතන්ත්‍රයකි 4. ස්වීය නිර්මාණයකි

29) නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ "සොඳුරු ආශ්‍රදයකයා" නම් ශාස්ත්‍රීය ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
1. හෙන්රි ජයසේන මහතා 2. සුගතපාල ද සිල්වා මහතා
3. බන්දුල ජයවර්ධන මහතා 4. සයිමන් නවගත්තේගම මහතා

30) සුගතපාල ද සිල්වා මහතා විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර නාට්‍යයක් නොවන්නේ,
1. බෝඩිංකාරයෝ 2. තට්ටු ගෙවල් 3. දූන්න දූනා ගමුවේ 4. මරාසාද්

31) ජන කරලිය ජංගම රඟ මඬල ආරම්භ කරන ලද නාට්‍යකරු වන්නේ,
1. සුගතපාල ද සිල්වා මහතා 2. පරාක්‍රම නිරිඇල්ල මහතා
3. හෙන්රි ජයසේන මහතා 4. බන්දුල ජයවර්ධන මහතා

32) හෙන්රි ජයසේන මහතාගේ හුණුවටයේ කතාව නාට්‍යයේ ග්‍රෑෂාගේ චරිතය රඟපෑ රංගන ශිල්පිනිය නම්,
1. අයිරාංගනී සේරසිංහ මිය 2. දීපානි සිල්වා මිය
3. අනුලා බුලත්සිංහල මිය 4. මානෙල් ජයසේන මිය

33) විජය නන්දසිරි මහතා හා ශ්‍රියන්ත මෙන්ඩිස් මහතා රඟන ලද නාට්‍ය යුගල වන්නේ,

1. මනමේ හා සිංහබාහු ය.
2. කුස පබාවතී හා තාරාවෝ ඉගිලෙති
3. කුස පබාවතී හා තලමල පිපිලා
4. පුත්‍ර සමාගම හා පාරාජය

34) මහාසාර නාට්‍යයේ රඟන ලද රංගන ශිල්පිනියකි,

1. මානෙල් ජයසේන මිය
2. දීපානි සිල්වා මිය
3. කෞශල්‍යා ප්‍රනාන්දු මිය
4. අනුලා බුලත්සිංහල මිය

| පේළිය | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | ජනේලය | මරාසාද් | ගැළිලියෝ | කුවේණි |
| 2 | ගාමිණී සමරකෝන් | අනුලා බුලත්සිංහල | ඩග්ලස් රණසිංහ | කෞශල්‍යා ප්‍රනාන්දු |
| 3 | මූදු පුත්තු | පණ්ඩුකාභය | ස්වර්ණමාලි | හරිම බඩු හයක් |

35) මානෙල් ජයසේන හා විජේරත්න වරකාගොඩ රංගන ශිල්පීන් විසින් රඟන ලද නාට්‍ය දැක්වෙන්නේ,

1. 1 පේළියේ A හා D තීරුවේ ය.
2. 1 පේළියේ B හා C තීරුවේ ය.
3. 3 පේළියේ A හා C තීරුවේ ය.
4. 3 පේළියේ B හා D තීරුවේ ය.

36) 1960 දශකයේ වේදිකා රංගනයට පිවිසි රංගන ශිල්පීන් සඳහන් වෙන්නේ,

1. 2 පේළියේ A හා C තීරුවල
2. 2 පේළියේ B හා D තීරුවල
3. 2 පේළියේ A හා D තීරුවල
4. 3 පේළියේ B හා C තීරුවල

37) පරිවර්තන නාට්‍ය සඳහන් වන්නේ,

1. 1 පේළියේ A හා B තීරුවල
2. 1 පේළියේ B හා C තීරුවල
3. 3 පේළියේ A හා C තීරුවල
4. 3 පේළියේ B හා D තීරුවල

38) සයිමන් නවගත්තේගම හා බන්දුල ජයවර්ධන විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණ සඳහන් වන්නේ.

1. 3 පේළියේ A හා B තීරුවල
2. 3 පේළියේ B හා C තීරුවල
3. 1 පේළියේ A හා D තීරුවල
4. 1 පේළියේ B හා D තීරුවල

39) අනුවර්තන නාට්‍ය සඳහන් වන්නේ,

1. 1 පේළියේ B හා C තීරුවල
2. 1 පේළියේ A හා C තීරුවල
3. 3 පේළියේ A හා C තීරුවල
4. 3 පේළියේ A හා D තීරුවල

40) බෙරහඬ හා ඇන්ටිගනි නාට්‍යයන්හි රඟපාන ලද රංගන ශිල්පීන් සඳහන් වන්නේ,

1. 2 පේළියේ A හා B තීරුවල
2. 2 පේළියේ B හා C තීරුවල
3. 2 පේළියේ A හා D තීරුවල
4. 3 පේළියේ B හා D තීරුවල

**කැලණිය අධ්‍යාපන කලාපය**

දෙවන වාර පරීක්ෂණය - 2016 ජූලි 10 ශ්‍රේණිය

**නාට්‍ය හා රංග කලාව II**

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

I කොටස

(1) දික් පිටියා : (බිලී පිත්ත විසිකර) මේක එසේ මෙසේ ගඟක් නොවෙයි. මහා සමුද්‍රයටත් වඩා ගැඹුරුයි. කිඹුල්ලුන්, මෝරුන්, සිරිපිල්ලන් ගොඩ වාගෙයි.

කාලගෝල : එහෙනම් සකියෝ ඔහේ එගොඩ වෙන්නේ කොහොමද?

දික් පිටියා : මේ ගඟේ ඉන්න කිඹුල්ලුන්, මෝරුන්, මගේ හොඳම මිතුරෝ. උන්ගෙන් මට කිසිඳු උපද්‍රවයක් සිදු නොවේ.

කාලගෝල : අනේ වාසනාවන්, මේ සකියාට තව තවත් මිත්‍ර සම්පත් ලැබේවා. අනේ අපවත් මේ දියෙන් එගොඩ කරන්න.

1. දික්තල කාලගෝල නාට්‍ය පෙළ කාගේ කෘතියක්ද? (ල: 02)
2. නාට්‍යයේදී වේදිකාවේ සිදු කළ යුතු කාර්යයන් පිළිබඳව උපදෙස් සපයා ඇති පාඨ හඳුන්වන්නේ කුමක්ද? (ල: 02)
3. ඉහත සංවාදය ඇසුරෙන් එයට උදහරණයක් දෙන්න (ල: 02)
4. මෙහි නාඩගමේ ලක්ෂණ 02ක් ලියන්න (ල: 02)
5. මෙහි අදල පාර්ශවයන් අතර සිදුවන ගැටුම විසඳීම සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද? (ල: 02)
6. මෙහි පොතේ ගුරුගේ කාර්ය 2ක් ලියන්න (ල: 02)

(2) 1. කතාන්දරයක ලක්ෂණ 2ක් ලියන්න (ල: 02)
2. කතාන්දරයක හා නාට්‍යයක සමාන ලක්ෂණ 2ක් ලියන්න (ල: 04)
3. කතාන්දරයක හා නාට්‍යයක වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න (ල: 06)

(3) 1. වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන විවිධ කලා ප්‍රභේද 2ක් නම් කරන්න (ල: 02)
2. රූපවාහිනී නාට්‍යයක් හා වේදිකා නාට්‍යයක් අතර ඇති සමාන හා අසමානතා දෙක බැගින් ලියන්න. (ල: 04)
3. වේදිකා නාට්‍ය කලාවෙහි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ මොනවාද? (ල: 06)

(4) 1. අංග රචනය යනු කුමක්ද? (ල: 02)
2. අංග රචනයේදී භාවිත ද්‍රව්‍ය 4ක් ලියන්න. (ල: 04)
3. සරල අංග රචනය හා චරිතාංග අංග රචනය පැහැදිලි කරන්න (ල: 06)

(5) 1. පහත රට ශාන්ති කර්මයන් හි ඇතුළත් නාට්‍යමය පෙළපාලි 2ක් නම් කරන්න (ල: 02)

2. එම නාට්‍යමය පෙළපාලි හි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ 4ක් ලියන්න (ල: 04)

3. එම නාට්‍යමය ලක්ෂණ නාට්‍යමය පෙළපාලි හි ඇතුළත් චරිත ඇසුරින් පැහැදිලි කරන්න. (ල: 06)

(6) 1. නළුවරනය යනු කුමක්ද? (ල: 02)

2. නළුවරනයේදී අවධානය යොමු කළ යුතු කරුණු 2ක් ලියන්න (ල: 04)

3. නාට්‍යයක් සඳහා ඔබට නළුවරනය කිරීමට සිදු වුවහොත් නලුවරනය සිදුකරන ආකාරය පැහැදිලි කරන්න (ල: 06)

(7) 1. රංග අභ්‍යාස යනු මොනවාද? (ල: 02)

2. ඔබ දන්නා රංග අභ්‍යාස 4ක් ලියන්න (ල: 04)

3. රංගන ශිල්පීන්ට රංග කාර්යයේදී රංග අභ්‍යාස වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න (ල: 06)